# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.

## නිවිතිගල අධ්‍යාපන කලාපය.

## 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

පැවරුම :- 03 වන සතිය (2021.01.17 සිට 2021.01.23 දක්වා)

ඒකකය 01 :- **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.**

ක්‍රියාකාරකම :- **පෘතුගීසින් මුහුදුබඩින් නෙරපා දැමීම හා ලන්දේසි බලය තහවුරු වීම.**

හැඳින්වීම :- 1638 වර්ෂයේ ගිවිසුමෙන් පසුව පෘතුගීසින් මෙරටින් නෙරපා හැරීමට තවත් වසර 20ක් ගතවිය. එම කාලවකවානුව තුළ පෘතුගීසින් යටතේ පැවති ත්‍රිකුණාමලය, මීගමුව වැනි බලකොටු රැසක් යටත්කර ගැනීමට ලන්දේසීන්ට හා උඩරට රජුට හැකිවිය. මීගමුව හා ත්‍රිකුණාමලය වැනි ලන්දේසින් තමන්ට වාසිදායක ප්‍රදේශවල ලන්දේසි බලය තහවුරුකර ගනිමින් රජුට එම ප්‍රදේශ පවරා නොදීමට කටයුතුකර ඇත. මෙම නිසා දෙපිරිස අතර ගැටුම් ඇතිවිය. මෙම ගැටුම් සහිත පසුබිමක රජු ඉතා ඉවසිලිමත්ව කටයුතු කළ අතර ලන්දේසීන් සමග එකතුව 1658 දී පෘතුගීසින් මෙරටින් පළවා හැරීමට කටයුතු කර තිබේ.

*පියවර 01* :- පිටු අංක 05 සිට 09 දක්වා හොඳින් කියවාගන්න.

*පියවර 02* :- පසුගිය සතියේ ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් ඉහතින් ලබා දී ඇති හැඳින්වීම සටහන් කරන්න.

*පියවර 03* :- පහතින් ලබා දී ඇති ක්‍රියාකාරකම සටහන් කර ගනිමින් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.

***<u>ක්‍රියාකාරකම් අංක 03</u>***

01) ලන්දේසීන් හා උඩරට රජු අතර 1638 ඇති වූ ගිවිසුමේ කොන්දේසි අතරින් ලන්දේසින් අමතක කර දමා කටයුතු කළ වගන්තිය කුමක් ද?

02) මීගමුව හා ගාල්ල ප්‍රදේශ ලන්දේසීන් උඩරට රජුට භාර නොදීමට බලපෑ හේතුව ලියා දක්වන්න.

03) පෘතුගීසින් කොළඹ කොටුවෙන් නෙරපා දැමීමට කටයුතු කළ ලන්දේසි සෙනෙවියා කවුරුන් ද?

04) එක් යුරෝපීය ජාතියක් පළවා හැර එවැනිම තවත් යුරෝපීය පිරිසක් මෙරටට ගෙන්වා ගැනීම සමග මෙරට ජන සමාජය තුළ භාවිත වූ ප්‍රස්ථාව පිරුළ කුමක් ද?

❖ ලන්දේසි හා උඩරට රාජධානිය අතර පැවැති දූත සබඳතා හා බැඳි තොරතුරු ගලපා යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 05) | ක්‍රි.ව. 1602 | i. | කොර්නේලියස් වැකල් |
| 06) | ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ | ii. | ජොරිස්වෑන් ස්පිල්බර්ජන් |
| 07) | ක්‍රි.ව. 1688 | iii. | රජුගේ බිසව මිය යාම ගැන ලන්දේසි ශෝකය පල කිරීම |
| 08) | කොර්නේලියස් වැකල් | iv. | ජෙරාඩ් හල්ෆ්ඩ් |
| 09) | දෙවන රාජසිංහ රජු | v. | කලන් අල්බස් |

10) 1656 වර්ෂයේ ජෙනරල් ෆල්ෆ්වේ දූතගමනේදී හුවමාරු වූ තෑගි තුන බැගින් ලියා දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද
නිවිතිගල කලාප කාර්යාලය
ර/කලවාන ජාතික පාසල